# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/4 - 2012 අගෝස්තු මස 13 වැනි සඳුදා - 2012.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44.

**(87 වන අධිකාරය) භාර ආඥාපනත**

114 වැනි වගන්තිය යටතේ නියමය

"එම්. එච්. කාන්ජි පුන්‍ය භාරය" යන භාරයේ භාරකරුවන්, එනම්-

1. අබ්බස්අලි අක්බාර්අලි මහතා,
2. හුසිෆා අක්බර්අලි මහතා,
3. අලි අස්ගාර් අක්බර්අලි මහතා,
4. කාලිදා බාර්දායි මහත්මිය සහ
4. අලි රේසා බාර්දායි මහතා.

විසින් (87 වැනි අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වැනි වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම්කර ඇති හෙයින්,

ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් වන මම, එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය දෙන අතර-

(අ) එකී භාරයේ රීති යටතේ සහ කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස්, හැරල්ඩ් ටිරොන් මැතිව්ස් විසින් සහතික කරන ලද 2001 ජුනි මස 8 වැනි සහ 2001 සැප්තැම්බර් මස 18 වැනි දිනැති, අංක 61 දරන භාර ප්‍රකාශනය යටතේ යථා පරිදි පත් කරන ලද භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "එම්. එච්. කාන්ජි පුණ්‍ය භාරය" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු යැයි ද,

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ කවර හෝ විස්තරයකට අයත් චංචල හෝ නිශ්චල දේපළ, එකී භාරය වෙනුවෙන් මිලදී ගැනීම, භාර ගැනීම, දැරීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යැයි ද, සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු නිමිත්වල දී සහ නඩුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට ද,

1A - G 16424— 385 (2012/8)

උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට ද, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතියෙහි ලා හැකියාව හා බලය ඇත්තේ යැයි ද,

විධාන කර ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යැයි මට පෙනී යන ආකාරයකින් එය කලින් කළ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම, මා විසින් කරනු ලැබිය හැකි ය.

රවුෆ් හකීම්
අධිකරණ අමාත්‍ය.

2012 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

08 - 787

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.